**බුද්ධිමය දේපළ අරමුදල - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධිමය දේපළ අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.6,330,865 ක් වූ දේපළ පිරියත සහ උපකරණ දැනටමත් භාවිතයට ගනිමින් පැවතියද ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. 03 ප්‍රකාරව මෙකී වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව ඇස්තමේන්තුගත දෝෂය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | කාර්යාලය වෙනත් ස්ථානයකට රැගෙන යාමට පසුගිය කාලය පුරාම කටයුතු කරමින් පවතින බැවින් කාර්යාල සවිකිරීම්වල ඵලදායී ජීවකාලය පිළිබඳ ගැටළුකාරී තත්ත්වය පවතින බව තවදුරටත් දන්වමි. | ශ්‍රී ලං.රා.අ.ගි.ප්‍ර.03 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 සහ 2022 දෙසැම්බර් 20 දිනැති අංක 01/2020 (ii) | සේවා සම්පාදනය සඳහා අයකරන ගාස්තු ඉහළ නංවා නොමැති සියලුම රාජ්‍ය ආයතන ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතු වුවද, ගාස්තු | නව ගාස්තු ගැසට් පත්‍රයේ පළ කිරීමට පෙර, ඊට අදාල කැබිනට් පත්‍රිකා කෙටුම්පත හා නව සංශෝධිත ගාස්තු ඇතුළත් ගැසට් පත්‍රය 2023 අප්‍රේල් | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සංශෝධනය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 12 දින වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |

**1.7 ආයෝජන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අරමුදල් ගිණුමේ අනුගාමී මාස 4ක් තුළ රු. මිලියන 10 ක සිට රු. මිලියන 15 ක් අතර පරාසයක ශේෂයක් පැවති අතර අතිරික්ත මුදල් ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කර නොතිබුණි. | කාර්යාලයේ දෛනික ආදායම් ලැබීමේ අවශ්‍යතාවයන් අනුව වියදම් කළමනාකරණය කර ගැනීමට හැකිවන පරිදි මුදල් ශේෂය පවත්වා ගෙන ඒ අනුව අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර ඇති බව. | අරමුදල් ගිණුමේ අතිරික්ත මුදල් ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.174,567,112 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.68,822,100 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.105,745,012 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන පොලී ආදායම රු. 118,552,063 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩමේ අයිතිය පවරා ගැනීමකින් තොරව බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු.22,298,752 ක මුදලක් වියදම් කර තිබියදී ඒ ආශ්‍රිත ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගෙන තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වැය කළ මුදල සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර ගැනීමට නොහැකිවී තිබුණි. | වැය වූ රු.22,298,752 ක මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට 2014 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලද, නමුත් මේ දක්වා එම මුදල් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ප්‍රතිපූර්ණය කර නොමැති අතර එම මුදල අයකරගැනීමට කටයුතු කරමින් සිටින බව. | නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් එම මුදල ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබූ රු.273,083 ක වැට් බදු මුදල් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | එකතු කළ අගය මත බදු පිළිබඳ ගොණුවේ 2016 වර්ෂයේ කටයුතු අවසන් වූ පසු ඉදිරි වර්ෂ සඳහා අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම මුදල සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකරන බව අදාළ ආයතනය විසින් දැනුම් දී ඇති බව. | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | භූගෝලීය දර්ශක ලියාපදිංචිය සඳහා වූ රෙගුලාසි අනුමත කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී ද එම ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීමේ කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | 2022 වර්ෂයේ රට තුළ පැවති අර්බුදකාරී තත්වය හේතුවෙන්, සාමාන්‍ය රාජකාරි කටයුතු පවත්වාගෙන යාමට බාධා විය.මේ වන විට අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවීමට සූදානම් කර ඇති බව. | ලියාපදිංචිය සඳහා වූ රෙගුලාසි අනුමත කර ගැනීම කඩිනම් කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා 431 දෙනෙකු ඉල්ලුම් කර තිබූ අතර 2023 අප්‍රේල් 30 දින වන විට ඉන් පේටන්ට් බලපත්‍ර 5ක් පමණක් නිකුත් කර තිබුණි. | 2023 මැයි 04 දින වන විට 2022 වර්ෂයේ ලද අයදුම්පත්වලින් අයදුම්පත් 5ක් ගැසට් පත්‍රයේ පල කර ඇති අතර එක් අයදුම්පතක් ගැසට් පත්‍රයේ පල කිරීමට සූදානම් කර ඇත. | ප්‍රමාදවීමට හේතුවන කරුණු හඳුනාගෙන විසඳුම් ගැනීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා ලද ඉල්ලුම්පත්‍ර 9465 කින් ඉල්ලුම්පත්‍ර 531 ක් එනම් සියයට 5.6 ක් පමණක් ප්‍රාථමික හා ද්විතික පරීක්ෂාවට ලක් කිරීම පමණක් සිදු කර තිබුණි. | 2022 වර්ෂයේදී ඉකුත් වසරවල ලැබී තිබූ අයදුම්පත් 8400 ක පමණ කටයුතු කිරීම නිසා 2022 වර්ෂයේ ලද අයදුම්පත්‍ර වල ප්‍රාථමික හා ද්විතියික පරීක්ෂාව සිදු කිරීම ප්‍රමාද විය. | -එම - |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී සිදුකල වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම් 3640 කින් ලියාපදිංචි කිරීම් 557 ක් 2012 වර්ෂයට පෙර ලද ඉල්ලුම්පත් වලින් වූ අතර, පනතේ 118(1) හා (2) වගන්ති ප්‍රකාරව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ දින සිට වර්ෂ 10 ක කාලයක් බලපත්‍රය වලංගු වන බැවින් වෙළඳ ලකුණු | ප්‍රමාදව ඇති ලියාපදිංචි කිරීම් කඩිනම් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් 2022 වර්ෂයේදී ආරම්භ කළ අතර ආයතනයෙහි පාලනයෙන් බැහැර හේතුන් මත එකී ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වූ අතර 2023 ජුනි සහ ජුලි මාසයන්හිදී සිදු කිරීමට සැලසුම් | -එම - |

| | | |
|---|---|---|
| ලියාපදිංචිය සිදුවන අවස්ථාව වන විටත් බලපත්‍රයේ වලංගුතාවයක් නොපැවතුණි. | කර ඇත. | |
| (ඇ) හේග් ජාත්‍යන්තර ගිවිසුමට ඇතුළත්වීමට 2019 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා වූ වර්ෂ 04 ක් තුල ව්‍යාපෘති අධ්‍යනයක් කර ඇතත්, එම ගිවිසුමට එළඹීමෙන් ශ්‍රී ලංකාවට ඇති වන වාසිදායක තත්වය පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතු බව හඳුනාගෙන ඇතත් එසේ කර නොතිබුණි. | සිදුකළ මූලික අධ්‍යයනයෙන් එම ගිවිසුම සඳහා එළඹීමෙන් ශ්‍රී ලංකාවට ඇති වන වාසිදායක තත්වය පිළිබඳව නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු කල යුතුව ඇති බව. | ශක්‍යතා අධ්‍යනය කඩිනම් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කර ඇති මුදල් රෙගුලාසි 877 හි (2) (ඉ) ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2023 අප්‍රේල් 30 දින වන විට 2019 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පමණක් පාර්ලිමේන්තු සභාගත කර තිබුණි. | සංශෝධිත 2020 වාර්තාව හා 2021 කාර්ය සාධන වාර්තාව ද ඉදිරි සති හතරක කාලය තුළදී අනුමැතිය සඳහා ඉදිරිපත් කර කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |